# පුංචි දඟකාර මී මැස්සා



*කේ. ඩී. ජී. ප්‍රබෝධ්‍යා*

*8 – B*

*මප/ මා/ බුද්ධඝෝෂ මහා විද්‍යාලය*

*හිතන් ඉන්න තැනට යන්න..*

*කියවන්න පොතක් ගන්න..*

## පුංචි දඟකාර මී මැස්සා

ඔන්න එකෝමත් එක කාලෙක පුංචි දඟකාර මී මැස්සක්  ඉතින් මේ පුංචි මී මැස්සා දවසක් උදේම නැගිට ඔහුගේ දෙමාපියන් ළඟට ගියා.

ඒ පුංචි දඟකාර මී මැස්සගේ නම තමා පැංචා. දැන්  පැංචා දෙමාපියන් ගාවට ගිහිල්ලා එද්දි පැංචගේ යාළුවන් දෙදෙනාම කැළෑවට යනවා දැකපු අපේ පැංචා යාළුවන් සමඟ ගියා.

ඔහොම ටික දුරක් යනක් නඉදලා ඔවුන්ට අමුතු විදිහේ යාළුවෙක් මුණගැහුණු විට ඒ අමුතු යාළුවා ඇහැවේ  එයාලා කොහේද යන්නේ කියලා.

ඔවුන් ඒ අමුතු යාළුවාගේ ඇහැවේ  ඇයි එයා ඔච්චර බය කියලා.  ඔයා කවුද කොහේ ඉදලද ආවේ කියලා ගොඩක්  විස්තර ඇහැවේ අපේ පැංචා.

ඔම තමයි තණකොලපෙත්තා. මම මෙතනින් එහාට්ට ඔයාලා වගේ යාළුවෝ දෙන්නෙක් එක්ක යනකොට මං නැති කොට මගේ යාළුවෝ දේනනා අතුරුදහන් උන නිසා  මම කාගෙන් හරි උදව්  ගන්න කියලා එන ගමන් ද්දි තමා  ඔයාලව  මට මුණගැහුනේ.

ඉතින් ඔයාලට පුළුවන්ද මගේ යාළුවො දෙන්නව හෙයලා දෙන්න.

හා. . .හ්. .හරි. . අපි තුන්දෙනාම ඔයාගෙල් යාළුවො දෙන්නා හොයලා දන්නම්.පුළුවන් ඉක්මණින්ම. කියලා අපේ පැංචා කිව්වේ  එයාලාගේ තණකොල පෙත්තාටයි.

ඔහොම තව ටික දුරක් යන කොට තමා හමු වුනේ  යාළුවෝ දේනනාව අතුරුදහන් උනතැනට ආ විට.මොවුන්ට සතුන් දෙන්නෙක් කෑ ගහන සද්දයක් ඇසු පමණින් විගස පියඹා ගිවේය.  ඔවුන් ඒ දෙසට වේගයෙන්  පියඹා ගියත්  වැඩක් වුණෝ නැහැ.

පැංචාට ආපසු උදව් ල්ලා කෑ ගසන සද්දයක් ඇසුන නිසා  පැංචා  පැංචගේ යාළුවන්ට කියුවා ඒ උනාට  පැංචගේ යාළුවන්ට ඇසුණ නැති නිසා  පැංචගේ යාළුවො හිතුවෙ පැංචා බොරු කිවුවා

කියලා. ඒත් එක්කම පැංචගේ යාළුවන්ටත් ඒ සද්දය ඇසුනා. පැංචා යාළුවන්ට කිව්වා මම කිව්වා නේද උදව් ඉල්ලා දෙන්නෙක් කෑ ගසන බව. කොහෙද මම් කියපු දේ ඇහැව් වෑනේ. දැන්වත් යමුනේද ඒ කෑගසපු පැත්තට.

සමාවෙන්න පැංචො අපි හිතුවේ ඔයා විහිළුවක් කිවුවා කියලා. හරි. . .හරි. . . අපි හතර දෙනාම  යමු කෑ ගසා උදව් ඉල්ලන පැත්තට.

අපි තව  මොකද මෙතන ඉන්නේ. අපි දැන් යමු නේද? හරි අපි යමුකො. ඔහොම  ටික දුරක් යනකොට එයාලට ගෙයක්  හමු වූවේ ඒ කෑගසපු සද්දෙ මේ පැත්තෙන් ඇසුන නිසා. ආයෙමත් ඒ සද්දෙ ඇසුනා. එයාලා දැක්කා ගෙදර ගාව තියෙන ළිඳ ළඟ කූඩුවක් තියෙනවා දැකපු පැංචා යාළුවෝ සමඟ ඒ කූඩුව ගාවට ගියා. ගිහින් බලනකොට ණකොලපෙත්තගේ යාළුවෝ දෙන්නා හිටියේ.

පැංචා කිවුවා මම මේ කූඩු අරින්නම්කෝ.  පැංචා කූඩුව ඇරියා විතරයි. තණකොලපෙත්තා  එයාගේ යාළුවො දෙන්නව බදාගත්තේ තනකොල පෙත්තගේ සතුට දරාගන්න බැරිඋන නිසා.

තණකොළපෙත්තා පැංචට මෙහෙම කිවුවා. ගොඩක් ස්තූතියි පැංචා. ඔයාලා තුන්දෙනාවම ගෙදර ඇරලවන්නම් කෝ. හරිද? කියලා තණකොළපෙත්තා කිව්වා.